පීල්ල වැව එල්ලංගාව කළමනාකරණ පැතිකඩ

හා මූලික සංවර්ධන සැලැස්ම

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය

නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය

වයඹ පළාත

පටුන

1.	හැඳින්වීම..	3
1.1	පීල්ල වැව එල්ලංගාව හා එහි පිහිටීම...	3
1.2	පීල්ල වැව එල්ලංගාව ආශ්‍රිතව පිහිටා ඇති අනෙකුත් එල්ලංගා.............................	4
1.3	පීල්ල වැව එල්ලංගාව හා සාමාන්‍ය තොරතුරු...	5
1.4	පීල්ල වැව එල්ලංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත්කම............	7
1.5	එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම..	7
1.6	පීල්ල වැව එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ අවශ්‍යතාවය......................................	10
1.7	පීල්ල වැව එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ අවශ්‍යතාවය....................................	10
1.8	එල්ලංගා පැතිකඩ සකස් කිරීමේදී භාවිතා කල ක්‍රමවේදය......................................	10
1.9	එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීමේ අරමුණු.	11
1.10	එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමනාකරණ මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම..	12
2	එල්ලංගා කළමනාකරණ සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය.	12
2.1	පීල්ල වැව එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හදුනා ගැනීම.........................	13
3	පීල්ල වැව එල්ලංගාවේ පැතිකඩ..	14
3.1	භූ විද්‍යාත්මක (Geological) තොරතුරු..	14
3.2	භූගෝලීය (Geographical)තොරතුරු..	15
3.3	ජල විද්‍යාත්මක තොරතුරු...	16
3.4	පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු..	17
3.5	එල්ලංගාවේ සමාජ ආර්ථික තොරතුරු...	19
3.6	එල්ලංගාවේ පවතින ඉදිකිරීම්..	22
3.7	එල්ලංගාවේ කෘෂිකාර්මික බෝග වගා රටාව..	23
3.8	එල්ලංගාවේ වාරිමාර්ග කළමනාකරණය..	23
4.	එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග...	24
5.	හඳුනාගත් ගැටලු අතරින් සැලකිල්ලට භාජනය කළ උග්‍ර ගැටළු...........................	25
6	යෝජිත ක්‍රියාකාරී සැලැස්ම හා දළ ඇස්තමේන්තුව - පීල්ල වැව එල්ලංගාව........	29

1. හැඳින්වීම

ප්‍රාථමික ජල මාර්ගයක හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති ජල විද්‍යාත්මක ලෙස එකට බැඳුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ වැව් පද්ධති හෝ කුඩා වැව්, මධ්‍ය ප්‍රමාණයේ වැව් සහ අමුණු පද්ධති, වලින් සමන්විත වූ ද්විතිය හා තෘතිය ජල මාර්ගයකට ජලය මුදා හරිනු ලබන මධ්‍ය ජල ධාරා ප්‍රදේශය එල්ලංගාව ලෙස හඳුන්වනු ලබයි. එල්ලංගාව අපගේ වාරි ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨ නිර්මාණයකි. එමගින් මුලු පරිසර පද්ධතියේම තිරසර පැවැත්ම තහවුරු කරයි.

වාරි ශිෂ්ඨාචාරයේ මාහැගි අමිල නිර්මාණයක් වන මෙම එල්ලංගාව සංරක්ෂණය කර මනා කළමනාකරණයක් තුලින් "දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ" සංවර්ධන කටයුතු තිරසර ලෙස පවත්වා ගෙන යාම සඳහා එල්ලංගා කළමනාකරණය පහසු කිරීමට ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගෙන් සහ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් සමන්විත එල්ලංගා කළමනාකරණ කමිටු පිහිටු වීමට ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය කටයුතු කරනු ලබයි. එල්ලංගාවේ සියලු පාර්ශව එකතු වී සියලු සම්පත් මනාව කළමනාකරණය කිරීම එල්ලංගා කළමනාකරණ කමිටුවල මූලික වගකීම වන අතර එම කාර්යය පහසු කිරීම සඳහා අවශ්‍ය සැලසුමක් සැකසීමට අවශ්‍ය තොරතුරු එකතු කිරීම සඳහා එල්ලංගා පැතිකඩක් පළාතේ සෑම එල්ලංගාවක් සඳහාම සකස් කරනු ලබයි. එල්ලංගා කළමනාකරණ කමිටුව හරහා එල්ලංගාව හා ජලධාරා ප්‍රදේශය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කළමනාකරණ සැලැස්ම සකස් කර ඇත. එල්ලංගා පැතිකඩක් සැකසීමේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ එල්ලංගා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීමයි.

1.1 පීල්ල වැව එල්ලංගාව හා එහි පිහිටීම

අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කුරුණෑගල දිස්ත්‍රික්කයේ උතුරු මායිමේ පිහිටා ඇති අතර උතුරින් ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ට ද, දකුණින් මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ට ද, නැගෙනහිරින් ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ට ද මායිම් වන අතර බටහිර මායිම වන්නේ කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි. මෙහි භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර් 136.96 ක් වේ. භූ විෂමතාවය අනුව සලකා බලන විට සමස්ථ භූමියම තැනිතලා ස්වරූපයක් ගනී. උපරිම උන්නතාංශය අඩි 315 ක් වන අතර එය දකුණු මායිමට ආසන්නව පිහිටා ඇත. අවම උන්නතාංශය අඩි 212 ක් පමණ වන අතර එය උතුරු මායිමේ මී ඔය ආසන්නයේ පිහිටා ඇත.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ අඹන්පොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඹන්පොළ ගොවිජන සේවා බල ප්‍රදේශයේ ග්‍රාම නිලදාරී කොට්ඨාස 02 ආවරණය කරමින් පීල්ල වැව එල්ලංගාව පිහිටා ඇත. එහි භූමි ප්‍රමාණය හෙක්ටයාර 1607.61 කි. එල්ලලංගා පද්ධතිය තුළ ගම්මාන 07ක් පිහිටා ඇත. පීල්ල වැව එල්ලංගාව සඳහා ජලය ස්වභාවික ඇළ මාර්ගයකින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් තේක්ක කැළය රක්ෂිතය සිට ගලා එයි. පීල්ල වැව එල්ලංගාවට ඇතුළත් වන ඇමති වැව, උස්වැව, කාසිකොටේ මහ වැව, කොළොන්ගස්යාය මහ වැව හි ජලය පීල්ල වැවට සම්බන්ධ වී ඉන් පසු මී ඔයට සම්බන්ධ වේ. එල්ලංගාවේ වැව් පද්ධතිය තුළ උස්වැව හා කොළොන්ගස්යාය මහ වැව හැර අනෙකුත් වැව් ප්‍රතිසංස්කරණය කර ඇත.

1.2 පීල්ල වැව එල්ලංගාව ආශ්‍රිතව පිහිටා ඇති අනෙකුත් එල්ලංගා

අඹන්පොල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල කුඩා පරිමාණයේ වැව් රාශියක් පිහිටා ඇත. එකිනෙක මත යැපෙන මෙම වැව් එල්ලංගා පද්ධතීන් සමූහයක් නියෝජනය කරයි. සුලු පරිමාණ වැව් 133 ක් සම්බන්ධයෙන් එල්ලංගාව පද්ධති 22 ක් අඹන්පොල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල පිහිටා ඇති අතර ඉන් විශාලතම එල්ලංගා පද්ධතිය වැව් 27 කින් සමන්විත පිදුරුවල්ල එල්ලංගාව වන අතර මැඩිල්ල අමුණ එල්ලංගාව වැව් 14 කින් යුක්ත වේ. මෙම එල්ලංගාව ආසන්නයෙන්ම පිහිටා ඇත්තේ මැඩිල්ල අමුණ හා අස්සැදුම එල්ලංගාවයි. මෙම එල්ලංගාව වැව් 14 කි. මෙම එල්ලංගා නිරීක්ෂණය කරන විට තවත් ලොකු හා කුඩා වැව් ඇතුලත් එල්ලංගා රැසක් පිහිටා ඇත. මෙම එල්ලංගා සැලකිල්ලට ගත්විට මෙම සියලු වැව් වල ජල ධාරිතාවය සලකා බැලිය යුතුය. තවද දෙවන අදියර යටතේ මෙම එල්ලංගාවේ තෝරාගත් වැව් කිහිපයක් පුණරුත්ථාපනය කිරීමට නියමිතය. එල්ලංගා 15 ක වැව් පුණරුත්ථාපනය කලද එල්ලංගා පද්ධති කළමනාකරණ වැඩ සටහන යටතේ තෝරාගෙන ඇත්තේ වැව් 03ක් හා ඊට වැඩිවැව් පවතින්නාවූ එල්ලංගා පමනි. ඒ අනුව අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල එල්ලංගා පද්ධති සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක වන්නේ පද්ධති 09 ක වන අතර මෙම එල්ලංගා බොහොමයක් එකිනෙකට ආසන්නයේ පිහිටා ඇත. මෙම සිතියම මගින් එල්ලංගා පිළිබඳව දළ අදහසක් ලබාදීමට උත්සාහගෙන ඇත.



ග්‍රාම නිලධාරි කොට්ඨාස, භූමි ප්‍රමාණය හා ගම් සංඛ්‍යාව

මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අඩ තැනිතලා කලාපයට අයත් වේ. පස පිළිබඳ සලකා බලන විට පෙනී යන්නේ බයෝටයිත් නයිස් හා ග්‍රැනයිට් නයිස් යන අවසාධිත පාෂාණයන් බහුලව දක්නට ඇති බවයි. කොට්ඨාසයේ ඓතිහාසික වැදගත්කම පිළිබඳ සලකා බැලිමේදි පුරාණ රජමහා විහාර හා පීල්ල නටඹුන් සුවිශේෂී ස්ථානයක් ගනු ලැබේ. සඳුන්ගිරි රජමහා විහාරය හා ගනේපුරාණ රජමහා විහාරය හා ගවරතිස්සාරාම විහාරය ඓතිහාසික වශයෙන් වැදගත් කමක් ඇති ස්ථාන වේ. වියළි කලාපිය දේශගුණයක් සහිත මෙම කොට්ඨාසයට වර්ෂාව ලැබෙනුයේ මෝසම් හා සංවහන වර්ෂා මගිනි. ඊසාන දිග මෝසම් වර්ෂාව මගින් සැප්තැම්බර් මස සිට පෙබරවාරි දක්වා වැඩි වර්ෂාපතනයක් ලැබෙන අතර, සංවහන වර්ෂාව මාර්තු අප්‍රේල් මාස වලදි ලැබේ.

වගු අංක 01 - ග්‍රාම නිලධාරි කොට්ඨාස, භූමි ප්‍රමාණය හා ගම් සංඛ්‍යාව

අනු අංකය	ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය	ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම	භූමි ප්‍රමාණය හෙක්ටයාර්	ගම්මාන සංඛ්‍යාව
01	182	කාසිකොටේ - නැගෙනහිර	872.06	03
02	183	කාසිකොටේ - බටහිර	735.55	04

පීල්ල වැව එල්ලංගා පද්ධතියේ සිතියම

සිතියම් අංක 01 - පීල්ල වැව එල්ලංගාව අයත් ග්‍රාම නිලධාරී වසම්



1.3 එල්ලංගාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු

තොරතුරු	විස්තරය
දිස්ත්‍රික්කය	කුරුණෑගල
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	අඹන්පොළ
මැතිවරණ බල ප්‍රදේශය	යාපහුව
ගංගා ද්‍රෝණියේ නම	මී ඔය ගංගා දෝණිය
එල්ලංගාවේ නම	පීල්ල වැව
ගොවිජන සේවා බල ප්‍රදේශය	අඹන්පොළ
ග්‍රාම නිලධාරී වසම්	කාසිකොටේ බටහිර, කාසිකොටේ නැගෙනහිර
එල්ලංගාවේ මුලු භූමි ප්‍රමාණය - හෙක්:	1607.61
ජලපෝශක ප්‍රදේශයේ නම	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් තේක්කවත්ත රක්ෂිතය හා කාසිකොටේ වන රක්ෂිතය
පැහැදිළි ජල පෝෂක සංඛ්‍යාව	02
කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කරන වැව් සංඛ්‍යාව	05

වනාන්තර ප්‍රදේශ	හෙක්. 323
එල්ලංගාව තුල ජීවත්වන ජන සංඛ්‍යාව	1881
ගෙවතු	හෙක්. 312
පුනරුත්ථාපනයට යොමු කල වැව් සංඛ්‍යාව	03
පුනරුත්ථාපනයට යොමු නොකල වැව් සංඛ්‍යාව	02

එල්ලංගාවේ වැව් පිලිබඳ සිතියම් හා තොරතුරු

වගු අංක 03 - අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල පිහිටි එල්ලංගා හා ඒ පිළිබඳ මූලික තොරතුරු

අංකය		පවුල් සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව		මුළු ජනගහනය	විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින්
	එල්ලංගාවේ තොරතුරු		පිරිමි	ගැහැණු		
1	කට්ටපුව	401	867	871	2139	19
2	දත්තාව මහවැව	93	109	127	149	10
3	තම්මනාව	162	380	385	927	8
4	පිදුරුවල්ලව වැව	651	1938	1927	4516	41
5	අබගම්මන වැව	55	64	75	88	8
6	හල්මිල්ලකොටුව	5	6	7	9	1
7	පොඩිකට්ටුව	118	421	430	936	8
8	පැල්ව වැව	55	64	75	88	103
9	කුඩාවැව	31	101	106	238	2.1
10	මැඩිල්ල අමුණ	189	221	259	303	21
11	මාමුණුගම	23	27	32	37	44
12	ගවරගම්මන වැව	89	248	132	469	4
13	මහදිඋල්වැව	58	68	329	649	6
14	අත්තන්වැව	62	194	219	475	4
15	බක්මීවැව	158	351	237	746	7
16	පලාපත්වැව	225	543	571	1339	12
17	ඇල්ලබඩගම වැව	162	425	409	996	9
18	එරමුදු වැව	254	437	464	1155	10
19	බොර වැව	91	210	222	523	5

20	කළුපෙරුම වැව	43	102	110	255	2
21	කොරකහ වැව	66	141	144	351	3
22	කිරිමැටියාව වැව	140	345	353	838	8
	මුළු	3131	7262	7484	17226	335

1.4 පීල්ල වැව එල්ලංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත්කම

මෙම පද්ධතිය තුල කුඹුරු වගාව මහ කන්නයේ හෙක්ටයාර 40 ක් හා යල කන්නයේ හෙක්ටයාර 16 ක් වන අතර නිෂ්පාදනය මහ කන්නයේ මෙට්‍රික් ටොන් 108 හා යල කන්නයේ මෙට්‍රික් ටොන් 43 ක් වේ. අනෙකුත් භෝග වගාවන් ලෙස රට කජු, බඩ ඉරිඟු, පැණි කොමඩු ප්‍රධාන වශයෙන් හඳුනාගෙන ඇති අතර යල කන්නයේ හෙක්ටයාර 41 ක මෙට්‍රික් ටොන් 80 ක නිෂ්පාදනයක් දක්නට ලැබේ. මහ කන්නයේ පවතින ජල හිඟය හේතුවෙන් වෙනත් ආහාර බෝග සඳහා ගොවීන් යොමු වීමේ ප්‍රවනතාවය අඩු බවක් දක්නට ලැබේ. ජලය අවම වශයෙන් යොදා ගන්නා බඩ ඉරිඟු බෝගය හෙක්ටයාර 8ක භූමි ප්‍රමාණයක වගා කර ඇති අතර ඉන් මෙට්‍රික් ටොන් 10 ක නිෂ්පාදනයක් ලබා ගෙන ඇත. එල්ලංගාව තුල සමස්ථ ජනගහනය 1881 කි. මෙම සියලු දෙනා එල්ලංගාව තුල විවිධ මානුෂික ක්‍රියාකාරකම් වල නිරත වේ. එම නිසා එල්ලංගා පද්ධතිය යම් තර්ජනයකට මුහුණ දෙමින් සිටී. කාලයක් තුල සිදුවී ඇති වන විනාශය හා හේන් වගාව හේතුවෙන් සිදුවන පාංශු ඛාදනය නිසා වැව් හා ඇල පද්ධතීන් ගොඩවීම එල්ලංගා පද්ධතියේ පැවැත්වමට ප්‍රබල තර්ජනයක්ව පවතී. පීල්ල වැව සහ කාසිකොටේ මහ වැව හැර අනෙකුත් වැව් වල ජලය සීඝ්‍රයෙන් සිඳී යාමේ අවදානමකට මුහුණපා ඇත. වැව් තාවුල්ල සහ ධාරා ප්‍රදේශයේ විනාශ වීම මෙන්ම දේශගුණික විපර්යාසයන් හේතුවෙන් මෙම තත්වය තව දුරටත් උග්‍රවනු ඇත. මෙම තත්වයට විසඳුම් වන්නේ එල්ලංගාවේ පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම, නැවත වන වගාවන් සිදු කිරීම සහ වගා කරුවන් සමග තිරසර වගා ක්‍රමයකට ප්‍රවිෂ්ඨ වීමයි. ඒ අනුව එල්ලංගාව තුළ එල්ලංගා කළමනාකරණ සැලැස්මක් සකස් කර පීල්ල වැව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා කටයුතු කිරීම සඳහා එල්ලංගා කළමනාකරණ කමිටුව සැලැස්මක් සකස් කර එය ක්‍රියාත්මක කරවීම සිදු කළ යුතුය.

1. 5 එල්ලංගා කළමනාකරණ කමිටු පිහිටුවීම

එල්ලංගා පද්ධතියක් යනු අතීතයේ සිට වැව් කළමනාකරණයේදී භාවිතා කරන ලද සාම්ප්‍රදායික ජල කළමනාකරණ ක්‍රමවේදයකි. එල්ලංගාව යන වචනය සිංහල භාෂාවේ වචන දෙකක් එකතු වී සකස් වී ඇත. එනම්, "එල්ලන්" සහ "ගාව" යන්නයි. එල්ලන් යනු එල්ලෙන යන්නයි. ගාව යනු එකකට පසු අනෙක් ඒවා යන්නයි. එල්ලංගාව යන වචනයේ අදහස වනුයේ ඉහල සිට පහලට එකිනෙකට සම්බන්ධිත ලඟින් පිහිටි වැව් පද්ධතියක් යන්නයි. ශ්‍රී ලංකාවේ මෙම වාරි තාක්ෂණය එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ලෝක උරුමයක් ලෙස නම් කර ඇත. එල්ලංගා කළමනාකරණ කමිටු පිහිටුවීමේ අදහස වනුයේ දශක කිහිපයකට පෙර පැවති ලෙස එල්ලංගාව පවත්වාගෙන යාම සහ එල්ලංගා කළමනාකරණ කමිටු පිහිටුවීමට, නීතිගත කිරීමට සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් පොදු සංසදයක් ලෙස වැඩ කර එල්ලංගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. පරිපාලන දිස්ත්‍රික්ක 11ක අදාල ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වල සහාය ඇතිව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 06/2023 දරන චක්‍ර ලේඛය අනුව (ඇමුණුම 01) එල්ලංගා කළමනාකරණ කමිටු 53ක් පිහිටුවීමට ගොවිජන සංවර්ධන

දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාල පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කර එල්ලංගා කළමනාකරණ කමිටු 53 පිහිටුවීමේ සමස්ථ ක්‍රියාවලිය සඳහා සහාය ලබාදේ.

එල්ලංගා කළමනාකරණ කමිටු සාමාජිකත්වය පහත ආයතන නියෝජිතයින්ගෙන් සමන්විත වේ. ඒවා නම්,

- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව
- පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- ප්‍රාදේශීය ලේකම්වරු
- ගොවි සංවිධාන
- ප්‍රජා මූලික සංවිධාන
- ජල සම්පත් මණ්ඩලය
- ආපදා කළමනාකරණ කාර්යාංශය
- පොලිස් දෙපාර්තමේන්තුව
- ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය
- පරිසර අධිකාරිය
- පෞද්ගලික අංශය
- ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව

යන ආයතන වේ.

එල්ලංගා කළමනාකරණ කමිටුවක මූලික වගකීම වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සහ උපාය මාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමයි. රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, ප්‍රජා මූල සංවිධාන ඇතුලු පාර්ශවකරුවන් රාශියකට එල්ලාංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ වගකීම පැවරී ඇත. ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහනේ දක්වා ඇත.

රූප සටහන 01- එල්ලංගා කළමනාකරණයට අදාළ ආයතනික රාමුව

1.6 එල්ලංගා කළමනාකරණ කමිටුවක අවශ්‍යතාව

මෙරට ඒකාබද්ධ කළමනාකරණ වැඩ සටහන් කිහිපයක් ක්‍රියාත්මක වෙමින් පවතී. ඉන් මහවැලි ව්‍යාපාරය හා ඉන්මාස් වැඩ සටහන ප්‍රමුඛතාවය ගනී. මෙම වැඩසටහන් ජලය හා බැදුනු මහා වාරිමාර්ග පදනම් කරගත් ව්‍යාපාර වේ. මෙම වැඩ සටහන් අතුරෙන් 1984 ආරම්භ වූ ඉන්මාස් වැඩ සටහන (මහා වාරිමාර්ග පුණරුත්ථාපන වැඩ සටහන - MIRP හා වාරිමාර්ග පද්ධති කළමනාකරණ වැඩ සටහන් - ISMP ව්‍යාපෘති) වැදගත් තැනක් ගනු ලබන්නේ එයද ලෝක බැංකු අනුග්‍රහයෙන් මෙරට ක්‍රියාත්මක වී අද දක්වාම සාර්ථකව ක්‍රියාත්මක වන බැවිනි. මෙරට මහ ගොවි ජනපද ව්‍යාපාර වල ගොවි සංවිධාන පිහිටුවීමේ ආරම්භක පියවරක් ගනු ලැබූවේ මෙම ඉන්මාස් වැඩ සටහන තුලින්ය. මෙම ගොවි ජනපද ව්‍යාපාර කළමනාකරණය කිරීම ව්‍යාපාර කළමනාකරණ කමිටුව මගින් සිදු වේ. මෙම එල්ලංගාව කළමනාකරණය කිරීම ද එල්ලංගා කළමනාකරණ කමිටුව මගින් ඉටු කිරීමට ලෝක බැංකුව අපේක්ෂා කරයි. ඉහතින් කියවෙන ව්‍යාපාර කළමනාකරණ කමිටුව හා මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බොහෝ දුරට සමානකම් දක්වයි. මෙහි කළමනාකාරිත්වය රජයේ නිලධාරින්ගේ හා එල්ලංගාවේ ප්‍රතිලාභීන් හවුල් කරගෙන හවුල් කළමනාකරණයක් දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරයි. ඉහත අංක1.7 දරණ ජේදයට අනුව මෙම එල්ලංගා කළමනාකරණ කමිටුවේ අන්තර්ගතය සටහන් කර ඇත . ඉතා වේගවත්ව හායනයට යමින් පවතින ලෝක උරුමයක් ලෙස හදුනාගෙන ඇති එල්ලංගාව නැවතත් තිරසරව පවත්වාගෙන යාමට මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බෙහෙවින් ඉවහල් වනු ඇත.

1.7 එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ අවශ්‍යතාවය

එල්ලංගාව පවත්වාගෙන යාම සඳහා අතීතයේ පැවති ග්‍රාමීය ආයතන ව්‍යුහය හා සමාජ ආර්ථික චත් පිලිවෙත්, සම්ප්‍රදායන් හා චාරිත්‍ර වාරිත්‍ර නිසා එල්ලංගාවේ තිරසර පැවැත්ම තහවුරු වූ අතර ක්‍රමානුකූලව මෙම තත්වයන් වෙනස් වීමත් සමග එල්ලංගා පද්ධතිය හායනයට පත් විය. වර්තමානය වන විට එය ඉතාමත් වේගයෙන් හායනයට ලක් වෙමින් පවතී. එල්ලංගා පද්ධති නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී, සම්පත් හායනය වලක්වා ගැනීමේදී හා මනා කළමනාකරණයක් කිරීමේදී එල්ලංගාවේ වර්තමාන තත්වය සහ පවතින ගැටළු හා ඒවා අතර ඇති වඩාත් උග්‍ර ගැටළු හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වේ. මේ සඳහා එල්ලංගාවේ භූගෝලීය ගැටළු, ජල විද්‍යාත්මක ගැටළු, පරිසර විද්‍යාත්මක ගැටළු හා සමාජ ආර්ථික ගැටළු හඳුනා ගත යුතු වේ. එසේම එල්ලංගාව තුල වර්තමානයේ සිදුවන මානව ක්‍රියාකාරකම් පිළිබඳව, විවිධ ක්‍රමවේද ඔස්සේ එනම් හරස්කඩ චාරිකා, ද්විතීය දත්ත සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා මගින් තොරතුරු එකතු කර එල්ලංගා පැතිකඩක් සකස් කර ඇත. මෙම පැතිකඩ එල්ලංගා පද්ධති කළමනාකරණයේදී මූලික අවශ්‍යතාවයකි.

1.8 එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ දී අනුගමනය කල ක්‍රමවේදය

පීල්ල වැව එල්ලංගාව පැතිකඩක් සකස් කිරීමේ දී පහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කරනු ලැබීය. එල්ලංගා කළමනාකරණ කමිටුවේ විශේෂ රැස්වීමක දී එල්ලංගා පැතිකඩක අවශ්‍යතාවය හා ඒ තුලින් එල්ලංගා සංවර්ධන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය සාකච්ඡාවට ගනු ලැබීය. එම පැහැදිලි කිරීම් අනුව එල්ලංගා කළමනාකරණ කමිටුවේ සියලු සාමාජිකයින් මෙම හරස්කඩ චාරිකාව සංවිධානය කිරීමට එකගතාවය පලකරන ලදී. ඉන් අනතුරුව එල්ලංගා කළමනාකරණ කමිටුවේ නියෝජිතයන් හා ගොවි සංවිධාන නියෝජිතයන් සමග

එල්ලංගා හරස්කඩ චාරිකාව සැලසුම් කරන ලදී. මේ සඳහා යෝජිත දිනය ලෙස යොදා ගනු ලැබුවේ 2024.08.14 දිනයයි. මෙම චාරිකාව කණ්ඩායම් 5 කින් යුක්ත විය.

01කණ්ඩායම් - පීල්ල ගොවි සංවිධානයේ හිටපු සභාපති රුවන් මහතාගේ මග පෙන්වීම යටතේ පීල්ල වැවේ සිට කි.මී. 02 ක දුර ගමන් මගකි.
02 කණ්ඩායම - කාසිකොටේ ගොවි සංවිධානයේ ගරු සභාපති රුවන් මහතාගේ මග පෙන්වීම යටතේ කාසිකොටේ මහ වැව දක්වා ගමන් මග දුර කි. මී. 3 කි.
03 කණ්ඩායම - ඇමති වැව අසල ගොවි මහතෙකු සහ මහත්මියක සමග වැව සහ ඒ අසල ගමන් මග කි. මී. 2 කි.
04 කණ්ඩායම - කොළොන්ගස්යාය වැව යටතේ වගාව සිදු කරන ගොවි මහතෙකු සමග වැව සහ ඒ අවට ප්‍රදේශයේ ගමන් මග කි. මී. 3 ක දුර කි.
05 කණ්ඩායම - උස්වැව වැවට අයත් ගොවි සංවිධානයක ගොවි මහතෙකු සමග සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාව කි. මී. 3 ක දුර කි.

මෙම සැලැස්ම අනුව පීල්ල වැව එල්ලංගා පද්ධති චාරිකාව කිලෝ මීටර් 13 කින් යුක්ත විය. මේ සමග ගොවි සංවිධාන සමඟ නිලධාරි කණ්ඩායම් අනුයුක්ත කරවීය.
මෙදින ලබාගත් දත්ත නැවත එල්ලංගා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කර එම දත්ත වල නිවැරදිතාවය සටහන් කර ගැනීමට යෙදිනි. මීටර් 100 න් 100 ට තොරතුරු ලබා ගන්නා ලද අතර ගමන් මාර්ගයේ භූගෝලීය තොරතුරු, භූ විද්‍යාත්මක තොරතුරු, ජල විද්‍යාත්මක තොරතුරු, පරිසර විද්‍යාත්මක තොරතුරු, සමාජ ආර්ථික තොරතුරු සම්පත් හායනය හා සම්පත් හායනයේ බරපතලකම පිළිබඳව නිරීක්ෂණ හා සාකච්ඡා මගින් තොරතුරු එකතු කර ගන්නා ලදී. හරස්කඩ චාරිකාව සඳහා ප්‍රතිලාභීන් ගොවි සංවිධාන සාමාජිකයින් හා සියලු රාජ්‍ය ආයතන වල නිලධාරීන් සහභාගී වූ අතර චාරිකාවෙන් පසුව ඒ සඳහා සහභාගී වූ සියලු පාර්ශව වල සහභාගීත්වයෙන් වැඩමුළුවක් පවත්වා තොරතුරු වල නිරවද්‍යතාවය තවදුරටත් තහවුරු කරගන්නා ලදී. විශේෂයෙන්ම මෙම එල්ලංගා පැතිකඩේ ඇති තොරතුරු එල්ලංගා කළමනාකරණ මූලික සැලැස්ම සැකසීම සඳහා ඉතාමත් වැදගත් වන අතර එල්ලංගාව අධ්‍යනය කරනු ලබන අයට එල්ලංගාව පිළිබඳව තොරතුරු ලබා ගැනීමේදී සහ එල්ලංගාවේ ඉදිරි සංවර්ධන සැලසුම් කිරීමේදී බෙහෙවින් ඉවහල් වනු ඇත.

1.9 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීමේ අරමුණු

එල්ලංගා පද්ධතියේ සම්පත් ආරක්ෂා කිරීම සහ තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා එල්ලංගා කළමනාකරණ වැඩසටහනක් දැඩි ලෙස අවශ්‍ය වී ඇත. එසේම එල්ලංගාවේ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සුදුසු ආයතන ව්‍යුහයක් හරහා ඒකාබද්ධව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගාව කළමනාකරණය කල යුතුවේ. ඒ සඳහා පහත අරමුණු ඉටු කර ගැනීම සඳහා එල්ලංගා පැතිකඩ සහ කළමනාකරණ සැලැස්මක් සකස් කරනු ලැබේ. ප්‍රධාන වශයෙන් භූගෝල විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, බෝග වගා රටාවන් සහ මානව ක්‍රියාකාරකම් නිසා එල්ලංගා පද්ධතියට වන හානි පිළිබඳ තොරතුරු සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) උපයෝගී කරගෙන සකස් කරන ලද සිතියමක්ද, ඇතුලත් විස්තරාත්මක එල්ලංගා පැතිකඩ (Cascade Profile) පාර්ශවකාර සංවිධාන වල ප්‍රයෝජනය සඳහා සැකසීම මගින් පාර්ශවකාර සංවිධාන වලට එල්ලංගාව සුරැකීමට පහසුකරණය කිරීම එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු විසඳීම සඳහා වන උපාය මාර්ගික මැදිහත් වීම්, ඒ සඳහා වන දල වියදම් ඇස්තමේන්තු, ක්‍රියාත්මක කිරීමේ කාල වකවානු සහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත්විය යුතු පාර්ශවකාර ආයතන යන මූලිකාංග ඇතුලත් එල්ලංගා පද්ධති කළමනාකරණ මූලික සැලැස්මක් (Cascade

Management Plan) සැකසීම. එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු සහ ඒවා මගින් එල්ලංගා පද්ධතියට සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින හානි පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින් හා පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

1.10 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමනාකරණ මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම

එල්ලංගා පැතිකඩ, ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා එනම් වර්ෂාව අඩු වීම, අවිධිමත් හේන් වගාව, වනාන්තර එළිපෙහෙළි කිරීම, සත්ව පාලන කටයුතු, කැලි කසල බැහැර කිරීම, පස් කැපීම, සහ වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ කිරීම යනාදී හේතු නිසා එල්ලංගාව හානියට පත්වී ඇති ආකාරය, එහිදි පාර්ශවකරුවන් වගකිව යුතු ක්ෂේත්‍ර හා ඔවුන්ගේ වගකීම් පිළිබඳව විවිධ මානයන් ඔස්සේ පාර්ශවකරුවන් හා ගොවි ප්‍රජාව අතර තොරතුරු හුවමාරු කරගැනීම සඳහා බෙහෙවින් ඉවහල් වේ. එල්ලංගා පැතිකඩ ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ප්‍රාදේශීය දේශපාලකයින්ට, පාර්ශවකාර ආයතන වලට සහ ගොවීන්ට එල්ලංගාව පිළිබඳව නිවැරදි පින්තූරය දැකීමට සහ එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා නිවැරදි තීරණ ගැනීමට තවදුරටත් වැදගත් වේ. එල්ලංගා පද්ධතිය ආරක්ෂා කර ගැනීමට සාමූහිකව හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කළමනාකරණ මූලික සැලැස්මක් සැකසීම(Cascade Management Plan) සඳහා එල්ලංගා පැතිකඩ විශේෂයෙන්ම වැදගත් වේ. මෙහි සඳහන් මූලික එල්ලංගා කළමනාකරණ සැලැස්ම එල්ලංගා කළමනාකරණ කමිටුව විසින් සකස් කරන ලද එල්ලංගා පැතිකඩ පදනම් කරගෙන සකස් කර ඇත.

02 එල්ලංගා කළමනාකරණ සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය

පීල්ල වැව එල්ලංගාවේ පවතින තත්වය දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් විශ්ලේෂණය කිරීමෙන් පසුව එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා එල්ලංගා කළමනාකරණ කමිටුවේ අවශ්‍යතාවය තහවුරු විය. මෙම අරමුණ ඉටුකර ගැනීමට සහභාගීත්ව ප්‍රවේශයකින් යුත් එල්ලංගා කළමනාකරණ සැලැස්මක් අවශ්‍ය බව ද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියට අවබෝධ විය. එල්ලංගා කළමනාකරණ කමිටුවට විධිමත් එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කළමනාකරණ සැලැස්මක අවශ්‍යතාවය දැනෙන්නට විය. මේ අනුව එල්ලංගාව අධ්‍යනය කිරීමටත් දත්ත හා තොරතුරු ඒක් රැස් කරමින් එල්ලංගා පැතිකඩක් සකස් කිරීමටත් අවශ්‍ය විය. පිළිවෙලින් එල්ලංගාව අධ්‍යනය කිරීම ද්විතීය හා ප්‍රාථමික දත්ත හා තොරතුරු එකතු කිරීම, තොරතුරු ජනනය කිරීම එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ පූර්ව අවශ්‍යතාවයක් විය. එහිදී එල්ලංගා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම ක්ෂේත්‍රයේ මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධ කාර්යයකි. ඒ සඳහා එල්ලංගා කළමනාකරණ සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කල යුතු අතර එහිදී එල්ලංගාවේ භූ විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහු පාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනු ලබයි. දත්ත විශ්ලේෂණය, වාර්තා ලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන් මගින් ඒවායේ නිවැරදිභාවය තහවුරු කර ගැනීම සඳහා බහුවිධ දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්ය මණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කළමනාකරණ සැලැස්ම සැකසීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

(i) රැස්වීම් පැවැත්වීම
(ii) ද්විතීය දත්ත එකතු කිරීම
(iii) හරස්කඩ චාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම
(iv) එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම
(v) එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු මත පුරෝකථන කිරීම
(vi) එල්ලංගා පැතිකඩ සැකසීම
(vii) ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම, යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම
(viii) එල්ලංගා සැලැස්ම සැකසීම
(ix) පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කළමනාකරණ සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කිරීම
(x) එල්ලංගා කළමනාකරණ කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් සහ ප්‍රධාන ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සහ යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා දල ඇස්තමේන්තුවක් හා කෙටි කාලීන (Short Term), මධ්‍ය කාලීන (Medium Term) හා දීර්ඝ කාලීන (Long Term) වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු, එල්ලංගා කළමනාකරණ කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කළමනාකරණ සැලැස්මට ඇතුලත්වේ.

2 .1 පීල්ල වැව එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම

පීල්ල වැව එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග හඳුනා ගැනීම එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කළමනාකරණ සැලැස්ම සැකසීමේ ක්‍රියාවලියේ කාර්යයන් අතර එක් ප්‍රධාන කාර්යයකි. දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පළාත් 6ක දිස්ත්‍රික්ක 11ක එල්ලංගා පද්ධති 53ක් ආවරණය වන පරිදි එල්ලංගා කළමනාකරණ කමිටු 53ක් පිහිටුවීමට පහසුකරනය කිරීමෙන් පසුව, ව්‍යාපෘතියේ ඊළඟ කාර්යය වී ඇත්තේ සෑම එල්ලංගා කළමනාකරණ කමිටුවක් සඳහාම එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කළමනාකරණ සැලැස්මක් සකස් කර දීමට එල්ලංගා කළමනාකරණ කමිටුවට සහාය වීමයි. එල්ලංගාව සහ එල්ලංගාව මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීමට එල්ලංගා පැතිකඩ සැකසීම අතිශයින් වැදගත් වන අතර එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික එල්ලංගා කළමනාකරණ සැලැස්මක් සැකසීමට එල්ලංගා පැතිකඩ ඉතා වැදගත් වේ. ඒ අනුව අභියෝග හඳුනා ගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර තීරණය කිරීම, දත්ත එකතු කිරීම හා උත්පාදනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේද තීරණය කිරීම, එල්ලංගා පැතිකඩේ හා එල්ලංගා කළමනාකරණ සැලැස්මේ දත්ත හා තොරතුරු ජනනය කිරීම සඳහා ආකෘති සැකසීම සම්බන්ධයෙන් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් හා ලෝක බැංකු නිලධාරීන් එක්ව උපදේශන මට්ටමේ රැස්වීම් කීපයක්ම පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලේඛණ පරිශීලනය කිරීමට අමතරව සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ චාරිකා ක්‍රමවේදය එල්ලංගාව අධ්‍යනය කිරීම සඳහා ප්‍රධාන ක්‍රමවේදයක් ලෙස භාවිතා කරන ලදී. එහිදී එල්ලංගා හරහා චාරිකා කරමින් එල්ලංගාවේ ස්වභාවය සහ ප්‍රධාන අභියෝග හඳුනා ගන්නා ලදී. අභියෝග ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට වර්ගීකරණය කරන ලදී. ඒවා නම්

1. භූ විද්‍යාත්මක තොරතුරු
2. භූගෝලීය තොරතුරු
3. ජල විද්‍යාත්මක තොරතුරු
4. පාරිසරික විද්‍යාත්මක තොරතුරු
5. මානව හැසිරීම්
6. සමාජ ආර්ථික තොරතුරු
7. කෘෂිකාර්මික තොරතුරු
8. වාරිමාර්ග කළමනාකරණ
9. පෝෂිත ප්‍රදේශයේ තත්වය යන ආදිය යි.

මේවා එල්ලංගා කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේදී භාවිතා කිරීම සඳහා එල්ලංගා පැතිකඩේ විස්තරාත්මකව දක්වා ඇත. මෙම අභියෝග තව දුරටත් විග්‍රහ කර උග්‍ර ගැටලු හඳුනා ගෙන ඒවායේ නිවැරදිතාවය තහවුරු කර ගෙන ඒවා පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ, පාර්ශවකරුවන්ගේ සහ ආධාරකරුවන්ගේ කඩිනම් අවධානය යොමු කරවීමට එල්ලාංගා කළමනාකරණ සැලැස්මට ඇතුලත් කර ඇත.

3 පීල්ල වැව එල්ලංගාවේ පැතිකඩ

3.1 භූ විද්‍යාත්මක (Geological) තොරතුරු

මෙම එල්ලංගව අයත් ප්‍රාදේශීය කොට්ඨාසයේ පස පිළිබඳ සලකා බැලිමේදි පාංශු බාණ්ඩ තුනක් මෙම ප්‍රදේශයේ දැකිය හැකිය. දූර්වල ජල වහනයක් පවතින රතු දුඹුරු පස, රතු දුඹුරු පසෙහි ක්ෂාරිය නොවන දුඹුරු පස හා දියළු පස එම පස් වර්ග වේ. ඒ අනුව මෙම එල්ලංගාවේ බහුලවම දක්නට ලැබෙන්නේ රතු දුඹුරු පසෙහි ක්ෂාරිය නොවන දුඹුරු පසකි. එහෙත් කුඹුරු වල ලොම් පසක් පවති. හෙක්ටයාර 1607 පුරා ව්‍යාප්ත වී ඇති මෙම එල්ලංගාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 30% පමණ වනාන්තර ප්‍රදේශයක් වන අතර කුඹුරු ලෙස 7% පමණ ද වෙනත් බෝග සඳහා සහ අනෙකුත් පරිබෝජනය සඳහා 15% පමණ ද යොදා ගෙන ඇත.

සිතියම් අංක 02 - පීල්ල වැව එල්ලංගාව අයත් ග්‍රාම නිලධාරී වසම් වල පස



3.2 භූගෝලීය (Geographical) තොරතුරු

අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කුරුණෑගල දිස්ත්‍රික්කයේ උතුරු මායිමේ පිහිටා ඇති අතර උතුරින් ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද, දකුණින් මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද නැගෙනහිරින් ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ට ද මායිම් වන අතර බටහිර මායිම වන්නේ කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යි. මෙහි භූමි ප්‍රමාණය හෙක්ටයාර 1607 ක් වේ. භූ විෂමතාවය අනුව සලකා බලන විට සමස්ථ භූමියම තැනිතලා ස්වරූපයක් ගනි. උපරිම උන්නතාංශය අඩි 315 ක් වන අතර එය දකුණු මායිමට ආසන්නව පිහිටා ඇත. අවම උන්නතාංශය අඩි 212 ක් පමණ වන අතර එය උතුරු මායිමේ මී ඔය ආසන්නයේ පිහිටා ඇත.

3.3 ජල විද්‍යාත්මක තොරතුරු

වගු අංක 04 - ජල විද්‍යාත්මක තොරතුරු අනුව එල්ලංගාවට මාසිකව ලැබෙන වර්ෂාපතනය පහත පරිදි වේ.

මාසය	වර්ෂය			
	2020	2021	2022	2023
ජනවාරි	4.1	80.3	21.4	52.8
පෙබරවාරි	-	-	65.5	140.4
මාර්තු	-	51	23.5	116.3
අප්‍රේල්	127.0	-	63.3	-
මැයි	-	360.4	163.2	97.7
ජූනි	28.6	-	21.5	5.1
ජූලි	151.9	-	157.8	9.2
අගෝස්තු	48.7	-	90.3	9.5
සැප්තැම්බර්	155.2	-	22.6	189.8
ඔක්තෝබර්	45.7	289.7	159.6	223.3
නොවැම්බර්	237.6	368.29	221.0	690.5
දෙසැම්බර්	249.8	-	148.6	252.1

2023 වර්ෂයේ වාර්ෂික වර්ෂාපතන වෙනස්වීම් පහත පරිදි වේ.

ප්‍රස්තාර අංක 01 - වාර්ෂික වර්ෂාපතනය



ජනවාරි - මාර්තු අතර ලැබෙන වර්ෂාව අඩුවන අතර ජූනි, ජූලි, අගෝස්තු අතර පවතිනුයේ පිළිවෙළින් මි.මි.5.1, මි.මි.9.2 හා මි.මි.9.5 වේ. මෙය ඉතා අඩුම වර්ෂාපතනයකි. මෙම වර්ෂාපතන දත්ත අනුව එල්ලංගාවට උපරිම වර්ෂාපතනයක් ලැබී ඇත්තේ ඔක්තෝම්බර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල පිළිවෙළින් මි.මි.237, මි.මි. 690, මි.මි. 252 හා අප්‍රේල් මාසවල මි.මි.140 - මි.මි. 116 වශයෙනි. මෙසේ ලැබෙන වර්ෂාව හේතුවෙන් කුඩා ඇළ මාර්ග සහ දිය පහරවල් සක්‍රීය වේ. එමගින් මෙම වැව්වල එක්රැස් වන ජලය මගින් වැව් පිටාර ගැලීම සමග පීල්ල වැවට එක් රැස් වේ. වැව් සක්‍රීය වීමත් සමග ගොවීන් වගා කටයුතු වල නිරත වේ.

මෙම කලාපයේ වියළි කාලගුණික තත්ත්වයක් දක්නට ලැබෙන අතර වර්ෂය පුරා වියළි කාලගුණික තත්ත්වයක් දක්නට ලැබේ. වාර්ෂිකව ප්‍රදේශය පුරා පවතින උෂ්ණත්ව තත්ත්වයන් පහත පරිදි වේ.

වගු අංක 05 - වාර්ෂික උෂ්ණත්ව තත්ත්වයන්

මාසය	වර්ෂය			
	2020	2021	2022	2023
ජනවාරි	33.4	35.1	34.6	29.2
පෙබරවාරි	33.7	32.5	32.1	30.5
මාර්තු	35.5	34.4	30.7	33.1
අප්‍රේල්	34.8	33.0	31.6	34.4
මැයි	34.7	32.7	32.6	33.1
ජූනි	34.4	32.7	33.0	33.4
ජූලි	34.7	33.3	33.9	33.2
අගෝස්තු	34.5	34.8	35.3	34.9
සැප්තැම්බර්	33.9	34.1	33.6	32.2
ඔක්තෝබර්	33.7	31.3	31.9	31.7
නොවැම්බර්	33.8	30.1	30.6	31.3
දෙසැම්බර්	34.6	31.1	32.2	29.8

ප්‍රදේශයේ වාර්ෂික උෂ්ණත්ව තත්වයන් සැලකීමේදී වර්ෂය පුරාවට වියළි කාලගුණ තත්ත්වයක් දක්නට ලැබේ. ජනවාරි මාසයේ පමණක් අඩු උෂ්ණත්වයක් පෙන්නුම් කරයි. උෂ්ණත්වයට අදාළ දත්ත සැලැකිල්ලට ගෙනද වගාවන් සැලසුම් කල හැක.

3.4 පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු

පීල්ල වැව එල්ලංගා පද්ධතිය වැව් 05 කින් සමන්විතය. එය උස් වැව, ඇමති වැව, කොළොන්ගහ යාය වැව, කාසිකොටේ හා මහ වැව වශයෙනි.

පීල්ල වැව

පීල්ල වැවට උතුරින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් රක්ෂිතය වැවේ සිට කිලෝමීටර් 03 ක් පමණ දුරින් පිහිටා ඇත. ඒ තුළ කුළු වැවක් ඇත. වර්ෂා කාල වලදී වැවට උතුරු දෙසින් කිලෝමීටර් 03 ක් පමණ දුරින් ඇති ඇළ මාර්ගය දිගේ පීල්ල වැවට ජලය ගලා එන බව නිරීක්ෂණය විය. එම ඇළ මාර්ග මේ වන විට අබලන් වී ඇති අතර ජලය ගලා ඒම නිසියාකාරව සිදු නොවේ. මෙම වැව මගින් අක්කර 124 ක් වගා කිරීම සඳහා ජලය නිකුත් කරනු ලබයි. ගොවීන් 120 දෙනෙකු මෙම වැව යටතේ ගොවිතැන් කටයුතු සිදු කරයි. යල හා මහ කන්න දෙකම වී වගාව සිදු කරයි. යල කන්නයෙන් පසුව තුන්වන කන්නය සඳහා මුං, උඳු වැනි වගාවන් සිදු කිරීමට හැකි වුවත් ඒ සඳහා ගොවීන් පෙළඹවීම සඳහා සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා දීමෙන් මෙම ප්‍රදේශයේ වගා අස්වැන්න ඉහළ නංවා ගැනීමට හැකිවනු ඇත. වැවෙන් ජලය නිකුත් කළ පසු සුළු ඇළ පද්ධතියක් මගින් කුඹුරු සඳහා ජලය ගෙනයන අතර ඉන් පසු කුඹුරෙන් කුඹුරට ජලය ලබා දීම සිදුකරයි.

ඉදිකිරීම් සම්බන්ධ ගැටළු හා යෝජනා

ගැටළු

- වැව් බැම්මට දමා ඇති බොරළු තට්ටුව ප්‍රමාණවත් නොවන අතර සමහර ස්ථාන කැඩී ගොස් ඇත.
- පවතින වේලි පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවේ.

යෝජනා

- වේලි පද්ධතිය ලෙවල් කර නිසි පරිදි සකස් කිරීම.
- වැව් බැම්ම නැවත බොරළු දමා නිසි පරිදි සකස් කිරීම.

ඇමති වැව

පීල්ල වැව එල්ලංගා පද්ධතිය තුළ පිහිටි ඇමති වැව පීල්ල වැවට නැගෙනහිර දෙසින් කිලෝමීටර් 05 ක පමණ දුරින් පිහිටා ඇත. අක්කර 10 ක වගා වපසරියක් තුළ ගොවීන් දෙදෙනෙකු වගා කටයුතු සිදු කරයි. වැවේ පෝෂිත ප්‍රදේශයක් දක්නට ලැබෙන අතර එමගින් වැව පෝෂණය කරයි. ඇමති වැවේ වාන් ජලය පීල්ල වැවට යාම සඳහා නිර්මිත ඉදිකර ඇත. වැවෙහි කට්ටකඩුව පැහැදිලිව හඳුනාගත හැකිය. එය ග්‍රාමීය මාර්ගයකට මායිම්ව ඇත. වැව් ඉස්මත්තෙහි ආසන්නව කුකුල් ගොවිපලක් ඇත. කුකුල් කර්මාන්තයෙන් ඉවතලන ද්‍රව්‍ය වැවට ගලා නොයන ලෙස යම්කිසි ආරක්ෂිත වැඩ පිළිවෙළක් අනුගමනය කළ යුතු බවට නිරීක්ෂණය විය.

කොළොන්ගහයාය වැව

මෙය කාසිකොටේ මහ වැව ඉස්මත්තේ ඇති කුළු වැවකි. ගොඩවල ලෙස මෙය හඳුන්වා ඇති අතර පසුකාලීනව කුඹුරු අස්වද්දා ඇත. දැනට අක්කර 5 ½ ක් පමණ වී සහ වෙනත් ආහාර බෝග වගා කරනු ලැබේ. ගොවීන් 8 දෙනෙකු පමණ වගා කටයුතු වල නිරත වී ඇත. මෙය මුළින් ඇළ පාරක් ලෙස පැවති ඇති අතර බැලුංගල කන්දේ සිට එම ඇළ පාර සකස් කර මෙම වැව ඉදි කර ඇත. වැවෙන් ජලය ලබා ගැනීම සඳහා කැට සොරොව්වක් දැනට භාවිතා කරයි. මෙහි ජලය පිරුණු පසු වාන් මගින් ගලා ගොස් මහ වැවට එකතු වේ. වැව ප්‍රතිසංස්කරණයේ දී නිසි ප්‍රමිතියකින් තොරව අදාළ ඉදිකිරීම් සිදු කර ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.

1950 සිට මෙම වැව පැවති බවත් වගා කටයුතු කරන කුඹුරු ඉඩම් සඳහා තාවකාලික ඉඩම් දැනට ඇති බවත් එම ගොවි මහතා සමඟ පැවති සාකච්ඡාවේදී පැහැදිලි විය. කාන්දු වන ජල ප්‍රමාණය නවතා ගැනීම සඳහා වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට නිරීක්ෂණය විය. වැවෙහි ජලය පිරුණු විට ඉස්මත්ත කැලෑව දක්වා පැතිරී යන බව පෙන්වා දුන් ගොවි මහතා එම කැලෑ කොටස ඉවත් කළහොත් ජලය වැඩි ධාරිතාවක් රඳවා ගත හැකි බව දන්වන ලදි. මෙම වැව නිරීක්ෂණයේදී පැහැදිලි වුයේ ජල කාන්දුව වැලැක්වීමට කුඩා සොරොව්වක් ඉදිකිරීම අවශ්‍ය බවය.

කාසිකොටේ මහ වැව

අක්කර 45 ක පමණ කුඹුරු මෙම වැව යටතේ පවතින අතර ගොවීන් 56 දෙනෙකු වගා කටයුතු සිදු කරයි. යල හා මහ කන්න වගා කිරීම සිදු වන අතර වැවට අවශ්‍ය අංගයක් වන කට්ටකඩුව දක්නට නැත. අපවහන ජලය ඉවත් කිරීම සඳහා අපවහන පද්ධතියක් දක්නට නොලැබේ. ආක්‍රමණික ශාඛ විශාල ලෙස වැව පුරා පැතිරී ඇත. එය ඉවත් කිරීම සිදු කළ යුතුව ඇත. වැවෙහි ධාරා ප්‍රදේශයට අදාළ වැව් තාවුල්ලේ පොල් සිටුවා .ඒ සඳහා අයිතිකරුවන් ද සිටී. මෙයට අමතරව දෙහි, අඹ, පොල් සහ බහු වාර්ෂික බෝග වගා කොට ඇත.මෙහි වැව් තාවල්ලේ වැවෙහි ධාරා ප්‍රදේශය වෙන් කර දීම සඳහා සුදුසු බෝග වගා කිරීම සිදු කළ යුතුව ඇත. එමෙන්ම දැනට මෙම රක්ෂිතයේ වගා කර ඇති වගා කරුවන් සමග ගැටුමක් ඇති නොවන පරිදි ආර්ථික වටිනාකමක් ඇති සහ ධාරා ප්‍රදේශය ආරක්ෂා වන ලෙස වගාවන් සිදුකිරීම සුදුසු වේ.

වැව් තාවුල්ල තුල ගස් ගොම්මන, පෙරණය ගොඩ වල දක්නට නොලැබේ. මේ නිසා වර්ෂාකාලයේදී වැව් පිටාර ගැලීමෙන් ඉවත්වන වතුර ඇල මාර්ගයක් ඔස්සේ (Tail cannel) පහල වැව් වලට ගලා ඒම සිදුවේ. මේ හේතුවෙන් එල්ලංගාවේ පහලින් පවතින වැව් පස සෝදායාම මගින් ගොඩවීම දක්නට ලැබේ. තවද වැව් ඉස්මත්ත දක්වා කුඹුරු අස්වද්දා ඇති නිසා කුඹුරු සීසාන අවදියේදී කුඹුරුවල අතිරික්ත බොර ජලය පස් අංශු සමග වැවට මුදාහැරීම නිසා වැව් ගොඩ වීම තව දුරටත් සිදු වේ. පීල්ල මහ වැව විශාල වැවක් වන අතර උස්වැව, ඇමතිවැව, කොළොන්ගහයාය වැව සහ කාසිකොටේ මහ වැව දක්නට ලැබේ. මෙහි උස්වැව, ඇමතිවැව සහ කොළොන්ගහයාය වැව, කාසිකොටේ මහ වැවෙහි ජලය පීල්ල වැවට ගලා එනු ලැබේ.

මීට අමතරව අනෙකුත් වැව් වල ඉස්මත්තේ හා ඉහල ප්‍රදේශයේ හේන් වගාව සිදුකිරීම පාංශු සංරක්ෂණ ක්‍රම භාවිතා නොකිරීම ආදි කටයුතු හේතුවෙන් වැව් ගොඩවීම දක්නට ලැබේ.

තවද එල්ලංගාව තුල නිදැල්ලේ සැරි සරන ගව රංචු හා වසරේ යම් කාල වල පැමිණෙන වල් අලි නිසා එල්ලංගාවේ පවතින වැව් වල බැමි වලට හානි සිදුවේ. වල් ඌරන්, රිලවින්ගේ ගහනය එල්ලංගාව තුල අධිකව පවතී. ගවයින් අධිකව එල්ලංගාවේ සැරි සරන නිසා ආවේනික පැලෑටි, පලා වර්ග, ඖෂද පැලෑටි වදවී යාමේ අවදානමක් පවතී. කෝන්, පලු, වීර, ඉදි වැනි පලතුරු වර්ග වැව් එල්ලංගාවේ සුළු වශයෙන් දක්නට ලැබේ. අමතරව එල්ලංගාව තුල ගඩොල් කැපීම වැනි මානව ක්‍රියාකාරකම් දක්නට ලැබේ.

3.5 එල්ලංගාවේ සමාජ ආර්ථික තොරතුරු

එල්ලංගාව අයත් වන ග්‍රාම නිලධාරී වසම් දෙකෙහි ජනගහනය 1881 පමණ වන අතර ඉන් 49% (930) ගැහැණු ද, 51% (951) පිරිමි ද වේ. ග්‍රාම නිලධාරී වසමේ සියලුම ජනගහනය සිංහල වේ.

ප්‍රස්තාර අංක 02 - ජනගහන ව්‍යාප්තිය



මෙම ප්‍රදේශයේ සමස්ථ ජනගහනයෙන් 97% පමණම සිංහල බෞද්ධ වන අතර 3% ක කතෝලික ආගමික ජනගහනයක් දක්නට ලැබේ.



මෙම ජනගහනයෙන් වයස අවුරුදු 20ට අඩු ජනගහනය 616 ක් වන අතර වයස අවුරුදු 20-59 ත් අතර ජනගහනය 989ක් වේ. වයස අවුරුදු 60 හා ඉට ඉහළ ජනගහනය 258 කි.



ඉහත ප්‍රස්තාරය අනුව, මෙම එල්ලංගාවේ මුළු ජනගහනයෙන් 50% ක් පමණ වැඩ කරන වයසේ පසුවන ජනගහනය වේ. මේ අතරින් සේවා නියුක්තියේ ස්වභාවය අංශික වශයෙන් බෙදීයාම පහතින් දක්වා ඇත.



එල්ලංගාවේ සමස්ථ වැඩකරන ජනගහනයෙන් 42% ම කෘෂිකාර්මික කටයුතු වල යෙදී සිටින අතර රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවා නියුක්තිය පිළිවෙලින් 15% හා 16% වේ. ජනගහනයේ අධ්‍යාපන මට්ටම පිළිබඳව සලකා බැලීමේ දී ජනගහනය බෙදීයාම පහත පරිදි පෙන්නුම් කරනු ලබයි.



එල්ලංගාවේ ජනගහනයෙන් 90% පමණම යම් කිසි අධ්‍යාපනයක් ලබා ගත් අය වන අතර පාසල් නොගිය ජනගහනය සැලකිය නොහැකි මට්ටමේ ඉතා අඩු අගයක් පෙන්නුම් කරයි. අධ්‍යාපන මට්ටම අනුව ප්‍රදේශයේ සේවා නියුක්තිය පහත පරිදි වේ.



අධ්‍යාපන මට්ටම අනුව සේවා වියුක්තිය.



ප්‍රදේශය තුල 90% ක් පමණ ජනගහනයක් යම්කිසි අධ්‍යාපන මට්ටමක් ලබා තිබුණ ද අධ්‍යාපන මට්ටම අනුව සේවා වියුක්තිය ද ඉහළ මට්ටමක පවතින බව ඉහත ප්‍රස්තාරය අනුව පැහැදිළි වේ.

3.6 එල්ලංගාවේ පවතින ඉදිකිරීම්

එල්ලංගාව තුල විශේෂ ඉදිකිරීම් දක්නට නැත. පදිංචිය සහ වෙළදාම සඳහා ගොඩනැගිලි සුලු වශයෙන්ද ඉදිවෙමින් පවතී .මීට අමතරව වගාව සඳහා සිදුකෙරෙමින් පවතින විවිධ ඉදිකිරීම් දක්නට ලැබේ. එල්ලංගාව තුළ අලි මිනිස් ගැටුම ඉතා බරපතල බවට පත්ව ඇත. මේ සඳහා විසඳුමක් වශයෙන් අලි වැට ඉදිකර ගැනීමට ප්‍රජාව උත්සාහ දරයි. බොහෝ වගා බිම්වල උඩ පැලක් හා අලි වැටක් ඉදිකර ඇත. දේශගුණ සුහුරු ව්‍යාපෘතිය මෙම ප්‍රශ්නය ගැන විශේෂ අවධයානයක් යොමු කරන අතර 2020-2024 කාලසීමාවන් තුලදී අලිවැට ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සිදු කර ඇත.

ඉදිකිරීම් අතරින් මේ දින වල විශේෂත්වයක් ගන්නේ දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් සිදු කරනු ලබන වාරි කර්මාන්ත සම්බන්ධයෙනි. වැව් සොරොව්, කෘෂි ළිං, කෘෂි මාර්ග කිහිපයක් ප්‍රතිසංස්කරණය වෙමින් පවති. ප්‍රදේශය පුරා ඇති මුළු කෘෂි ළිං ගණන 27 කි. මෙමගින් හෙක්ටයාර 17 ක වගා බිම් සඳහා ජලය සපයනු ලැබේ. මීට අමතරව ප්‍රදේශයේ පානීය ජල අවශ්‍යතා සම්පූර්ණකර ගැනීම සඳහා විවිධ ජල යෝජනා ක්‍රම ක්‍රියාත්මක කර ඇත. කාසිකොටේ නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම තුල සිසිලස ප්‍රජාමූල සංවිධානය ක්‍රියාත්මක වන අතර එමගින් පවුල් 90ක් සඳහා ජල පහසුකම සපයනු ලබයි. කාසිකොටේ බටහිර ග්‍රාම නිලධාරී වසම තුල සයුරි ප්‍රජාමූල සංවිධානය හා දිනුදා ප්‍රජාමූල සංවිධානය මගින් පානීය ජල අවශ්‍යතාවය සම්පූර්ණ කරනු ලබයි. එමගින් පිළිවෙලින් පවුල් 152, 182 ලෙස ජල අවශ්‍යතාවය සම්පූර්ණ කරනු ලබයි.

3.7 එල්ලංගාවේ කෘෂිකාර්මික බෝග වගා රටාව

පීල්ල වැව එල්ලංගා පද්ධතියේ දිගුකාලීන තිරසාර සාර්ථකත්වය උදෙසා දේශගුණ සුහුරු කෘෂිකාර්මික සැලැස්මට තිරසාර කෘෂිකාර්මික තාක්‍ෂණය හා ජල පෝෂක කළමනාකරණය මෙන්ම දේශගුණ බලපෑම් වලට ඔරොත්තු දිය හැකි සාර්ථකත්වයෙන් යුත් මූලධර්ම හා ඒකාබද්ධ කිරීම කල යුතුව ඇත. තවද දිගුකාලීන සාර්ථකත්වය උදෙසා එහි පාර්ශවකරුවන් අතර සහයෝගිතාව වර්ධනය මෙන්ම ඔවුනොවුන්ගේ අවශ්‍යතා හඳුනාගෙන ප්‍රමුඛතාවය අනුව කටයුතු සැලසුම් සකස් කල යුතුය.
2024 වර්ෂයේදී එල්ලංගා මට්ටමින් බීජ බෙදා දුන් අතර වැඩි බීජ අස්වැන්න වෙනත් එල්ලංගාවන්ට ලබාදීමට සැලසුම් කර ඇත. වගා සැලැස්මක්ද සකස් කර ඇති අතර එය සාර්ථක වුවහොත් මෙම එල්ලංගාවේ වී සහ අතිරේක බෝග නිෂ්පාදන ඉහල යාමට හේතුවේ.
තවද, කෘෂි ආදර්ශ ගම්මාන වැඩසටහන යටතේ සියළු අංග වලින් සමන්විත ආදර්ශ ගම්මාන වැඩසටහන එල්ලංගාව තුල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. ඒ සඳහා දේශගුණ සුහුරු ව්‍යාපෘතිය යටතේ බීජ මෙන්ම බීජ වප්කර, නිෂ්පාදිත උපකරණ (මිරිස්, කහ, කජු, මඤ්ඤොක්කා) වැනි උපකරණ ලබාදීමට අපේක්ෂිතය. සූර්යය බල පැනල, ජල පොම්ප ප්‍රදේශයේ අවශ්‍යතාවය අනුව ලබාදීමට යෝජනා කර ඇත.
කෘෂිකර්ම දෙපර්තමේන්තුවේ, ගොවිජනසේවා දෙපාර්තමේන්තුවේ සහ ව්‍යාපෘතිය යටතේ නියුක්ත කෘෂි නිලධාරින් කලාප මට්ටමෙන් ගොවීන් සමග ඒකාබද්ධව කෘෂිකාර්මික ඉදිරි සැලස්මට අනුව වැඩ කටයුතු සිදුකරයි.

3.8 එල්ලංගාවේ වාරිමාර්ග කළමනාකරණය

එල්ලංගා පද්ධතිය තුල පිහිටි වැව් 05 ක් යටතේ වර්ෂාව ලැබීම අනුව මහ කන්නයේ වී වගා කරන අතර ජලය ඉතිරි වුවහොත් පමණක් යල කන්නයේ වෙනත් ආහාර බෝග වගාව සිදු කරනු ලබයි. මහ කන්නයේද අඛණ්ඩව වගාවන් සිදු නොවන අතර සමහර වැව් වල කන්න ගණනාවක් මහ කන්නයේදී පවා වගා කර නොමැත. විශේෂයෙන්ම ගංගා ද්‍රෝණියට ලැබෙන ජලය සංවර්ධනය කර තිබෙන වැව් වල ප්‍රමාණයට ප්‍රමාණවත් නොවීම නිසා මහ කන්නයේද වගාව සිදු කිරීමට අපහසු වී ඇත. ඒවායේ ක්‍රියාකාරීත්වයද දුර්වල වී ඇත.
එල්ලංගාවේ වාරිමාර්ග කටයුතු සක්‍රීය වන්නේ මුළුමනින්ම ලැබෙන වර්ෂාපතනය අනුවයි. එතෙක් වැව්වල පවතින්නේ ඉතා සුළු ජල ප්‍රමාණයකි. භූ විෂමතාවය අනුව වැවෙන් ජලය ලබා ගත හැකි වගා බිම් වල ජලය ලබා ගෙන වගා කරයි. ගොවි සංවිධානයේ මැදිහත්වීම මත ජලය බෙදා හැරීමක් සිදු වේ.

4 එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග

පසුගිය චාරිකාවේ දී මෙන්ම, ගොවි සංවිධාන, එල්ලංගා කළමනාකරණ කමිටුව හා නිළධාරීන් ක්ෂේත්‍ර චාරිකාවලදී හදුනාගත් මෙම ගැටළු විශේෂ ස්ථානයක් ගනී. තවද එල්ලංගා පැතිකඩ වාර්ථාවට අනුව පහත අභියෝගයන් හදුනාගෙන ඇත.

1. වැව් ඉස්මත්ත හා වැව් තාවුල්ල භූමිය අනවසරයෙන් අල්ලාගෙන වගා කිරීම.
2. අවිධිමත් සීමා මායිම් කනු යොදාගෙන වැව ඉස්මත්ත හා එල්ලංගාවේ භූමිය අනවසරයෙන් අල්ලා ගැනීම.
3. වැව ඉස්මත්තේ වන ආවරණයේ පෙරහණක් හෝ ගොඩවල නොමැති වීම නිසා වැව් වාර්ෂිකව දැඩිලෙස ගොඩබිමේ තර්ජනයට මුහුණ පෑම.
4. වැව්වල කට්ටකඩුව නොමැති වීම නිසා බැම්මේ ආරක්ෂාව සහ ජල කාන්දුව ඇති විය හැකි වීම .
5. පානීය ජලය නොමැති පාංශු ලවණතාවයකින් ජලය සිදීයාමත් වැව්වල ජලය සීඝ්‍රයෙන් සිදීයාමත් නිසා පානීය ජලය සපයා ගැනීම ප්‍රබල ගැටලුවක් වී ඇත. වැව්වල ජලය රදා නොපැවතීම, පොළව අභ්‍යන්තරයට ජලය උරා නොගෙන මතුපිටින් වේගයෙන් කෙටි කාලයක් තුළ ජලය ගලා යාම වැනි කරුණු බලපා ඇත. මෙම තත්වය නිසා ජලය වැවේ රදා නොපැවතීමට බලපායි. රොන්මඩ හා වැලි වැව පතුළට ගලා ඒමෙන් වැව් ගොඩවීම මෙයට විශේෂයෙන් බලපා ඇත.
6. එල්ලංගාවේ වැව්වල ජල කළමනාකරණ හා මෙහෙයුම් හා නඩත්තුව ඉතා දුර්වල මට්ටමක පැවතීම විශේෂ අවධානයට යොමු කලයුතු කරුණකි.
7. සමස්ථයක් වශයෙන් වැව් පද්ධතියේ ජලය හිඟ වීම වර්ෂාව නියමිත වෙලාවට නොමැති වීම හෝ සම්පූර්ණයෙන්ම නොමැති විට (දේශගුණික විපර්යාසයට ගොදුරු වීම) නිසා වගා හානි හෝ වගාව ආරම්භ කිරීමට නොහැකි වීම බරපතල ගැටළුවකි. මෙම තත්වය දීර්ඝ කාලයක් පැවතිමෙන් ගොවියන්ගේ ආර්ථික හා පෝෂණ මට්ටම පාලනයට නොවැළැක්විය හැකි ගැටලුවක් විය හැකිය. මේ නිසා ප්‍රදේශයේ ජීවත් වන ජනතාව උග්‍ර දරිද්‍රතාවයකට මුහුණ දෙනු ඇත. මෙම තත්වයට ඔරොත්තු දෙන තාක්ෂණික සැලැස්මක් අවශ්‍ය වේ.
8. අලි මිනිස් ගැටුම එල්ලංගාව තුළ පවතින තවත් උග්‍ර ගැටලුවක් වී ඇත. අලි ගම් වැදීම වැලැක්විය නොහැකිය. ගොවීන්ගේ ගෙවතු නිවාස හා මිනිස් ජීවිත විනාශ කරමින් අලින් ගම්වල සැරි සරති. පොල් ගස් පෙරලීම, අඹ, කෙසෙල්, වෙනත් එලවළු බඩ ඉරිගු විනාශ කරයි. අලින් පමණක් නොව රිලවුන්, මොණරුන් හා වෙනත් සතුන් එල්ලංගාවේ ගොවි ජනතාවගේ ජීවන තත්වයට උග්‍ර අභියෝගයක් එල්ල කරමින් සිටී.

5 හඳුනාගත් ගැටලු අතරින් සැලකිල්ලට භාජනය කළ උග්‍ර ගැටළු

– පීල්ල වැව එල්ලංගා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කර ක්‍රියාත්මක සැලැස්මේ සංෂිප්ත වාර්තාව.

අනු අංක	උග්‍ර ගැටළු	යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම්	මැදිහත්වන ආයතන
1	හේන් වගාව නිසා සිදුවන පාංශු ඛාදනයෙන් වැව් ගොඩවීම.	I. CMC හිදී සාකච්ජා කිරීමට අදාල ස්ථාන හා හේන් ගොවීන් හඳුනා ගැනීම II. ගොවි සංවිධාන හා අදාල ගොවීන් දැනුවත් කිරීම III. පාංශු සංරක්ෂණ වැඩිදැමීම	1 CSIAP / (CMC) 2 ගොවිජන සං.දෙ. 3 පළාත් වාරි.දෙ. 4 ගොවි සංවිධාන 5 පළාත් කෘෂි.දෙ.
2	වාරිමාර්ග පද්ධතිය කැලෑවෙන් වැසී ඇත. නඩත්තු ඉතා දුර්වලයි. ගොවි සංවිධානයේ ආයතන සංවර්ධන විෂය තුළ පවතින දුර්වලතා.	I. CMC හිදී සාකච්ජා කිරීම II. ගොවි සං. සමග සාකච්චා කිරීම III. නඩත්තු සැලැස්මක් සකස්කිරීම IV. අරමුදලක් ගොඩ නැගීම හා ක්‍රියාත්මක කිරීම V. ආයතන සංවර්ධන කටයුතු පිළිබඳව පුහුණුවක් ලබාදීම	1 CSIAP / (CMC) 2 ගොවිජන සං.දෙ. 3 ගොවි සංවිධාන
3	කට්ටකඩුව, පෙරහන හා ගස්ගොම්මන නැත.	I. CMC හිදී සාකච්ජා කිරීම අදාල ස්ථාන හඳුනා ගැනීම I. කට්ටකඩුව තුල සිදුවන දෑ නිරීක්ෂණය කර එකාබද්ධ ක්‍රියාන්විතයකින් කට්ටකඩුව හා පෙරනය වෙන් කිරීම I. සුදුසු වෘක්ෂලතා ආවරණයක් ඇති කිරීම සඳහා පැල සිටුවීම	1 CSIAP / (CMC) 2 ගොවිජන සං.දෙ. 3 පළාත් වාරි.දෙ. 4 ගොවි සංවිධාන
4	කුඹුරු වල ලවණ වැඩිවීම නිසා අස්වැන්න අඩුවීම.	I. CMC හිදී සාකච්ජා කිරීමට අදාල ස්ථාන හඳුනා ගැනීම II. තාක්ෂණික උපදෙස් අනුව ක්‍රියාත්මක වීම III. කුනු ඇල පද්දතිය නඩත්තු කිරීම	1 CSIAP / (CMC) 2 ගොවිජන සං.දෙ. 3 පළාත් වාරි.දෙ. 4 ගොවි සංවිධාන 5 පළාත් කෘෂි.දෙ.
5	කෘෂි මාර්ග කැඩීම.	I. CMC හිදී සාකච්ජා කිරීමට අදාල ස්ථාන හඳුනා ගැනීම II. ක්ෂේත්‍රය පරික්ෂා කිරීම III. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම හා ඇස්තමේන්තුවක් ලබාගැනීම IV. ප්‍රතිපාදන සපයා ගැනීම V. ගොවි සංවිධානය මගින් අලුවැඩියා කිරීම	1 CSIAP / (CMC) 2 ගොවිජන සං.දෙ. 3 පළාත් වාරි.දෙ. 4 ගොවි සංවිධාන

6	වැව් වල මිරිදිය මත්ස්‍ය සම්පත නැත. (පීල්ල වැව සහ කාසිකොටේ)	I. CMC හිදී සාකච්ඡා කිරීම II. සුදුසු වැව් තෝරා ගැනීම III. මිරිදිය මත්ස්‍ය පැටවුන් මුදාහැරීම	1 CSIAP / CMC 2 ගොවිජන සං.දෙ. 3 ජල ජී.ව.සං.අධි. 4 ගොවි සංවිධාන
7	අවිධිමත් සත්ව පාලනය නිසා සිදුවන හානි. (වාරිමාර්ග පද්ධතියට හා වගාවන් සඳහා)	I. එල්ලංගා කළමනාකරණ කමිටුව සමග සාකච්චා කිරීම II. ස්ථාන හඳුනා ගැනීම III. තාක්ෂණික උපදෙස් අනුව ක්‍රියාත්මක වීම IV. ගොඩවල නඩත්තුව ගොවි සංවිධානයට පැවරීම	1 CSIAP / CMC 2 ගොවිජන සං.දෙ. 3 පළාත් වාරි.දෙ. 4 ගොවි සංවිධාන
8	වාන් ඇල හරහා කුඹුරු වලට ජලය ලබා ගැනීම නිසා ඇල කඩාගෙන යාම හා ජලය අපතේ යාම.	I. CMC හිදී සාකච්ඡා කිරීම II. ස්ථාන හඳුනා ගැනීම III. තක්සේරු කිරීම IV. තාක්ෂණික උපදෙස් සැලසුම් කිරීම හා ඉදිකිරීම් ගොවි සංවිධානයට පැවරීම	1 CSIAP / CMC 2 ගොවිජන සං දෙ 3 ගොවි සංවිධාන
9	වැව් වල රඳාපවතින ජලය වගාවට ප්‍රමාණවත් නැත. වැව් වල රොන් මඩ පිරි ඇත.	I. CMC හිදී සාකච්ඡා කිරීම II. සුදුසු වැව් තෝරා ගැනීම III. තාක්ෂණික උපදෙස් සැලසුම් කිරීම හා තක්සේරු කිරීම IV. ඉදිකිරීම් ගොවි සංවිධානයට පැවරීම	1 CSIAP/ CMC 2 ගොවිජන සං.දෙ. 3 ජල ජී.ව.සං. අධි. 4 ගොවි සංවිධාන
10	අලි මිනිස් ගැටුම් උග්‍ර වී ඇත. අලි ගහනය වැඩිවීම මිනිසුන් කැලෑව ආක්‍රමණය කිරීම.	I. CMC හිදී සාකච්ඡා කිරීම II. ගොවි සං. සමග සාකච්චා කිරීම III. වනජීවී ස.දෙ. හා වන සං.දෙ. සමග සුදුසු වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම IV. අරමුදලක් ගොඩ නැගීම හා ක්‍රියාත්මක කිරීම	1 CSIAP/ CMC 2 ගොවිජන සං.දෙ. 3 ගොවි සංවිධාන
11	අනවසරයෙන් වැව්/ රක්ෂිත අල්ලාගැනීම.	I. CMC හිදී සාකච්ඡා කිරීම හා අදාල ස්ථාන හඳුනා ගැනීම II. ගොවි සං. සමග සාකච්චා කිරීම III. අනවසරකරු ලේඛණයක් සකස්කිරීම IV. ඉවත් කිරීමට දැනුම්දීම V. නීතිමය පියවර ගැනීම	1 CSIAP/ CMC 2 ගොවිජන සං.දෙ. 3 පළාත් වාරි.දෙ. 4 ගොවි සංවිධාන

වගු අංක 07 - යෝජිත උපායමාර්ගික සැලැස්ම දළ ඇස්තමේන්තුව කාල රාමුව - පීල්ල වැව එල්ලංගාව

උග්‍ර ගැටළු හා විසඳීම සඳහා යෝජිත උපායමාර්ගික ක්‍රියාකාරකම්	දළ පිරි වැය (රු. මි.)	කාලරාමුව														ක්‍රියාත්මක කිරීමේ වගකීම් දරන ආයතන/ ආයතනය මැදිහත්වීම්	
		කෙටි කාලීන 2024						මධ්‍යකාලීන 2025				දිගුකාලීන				ප්‍රධාන	අනෙකුත්
1 හේන් වගාව නිසා සිදුවන පාංශු ඛාදනයෙන් වැව් ගොඩවීම.	0.3															1 CMC 2 CSIAP 3 ගොවිජන සං.දෙ. 4 පළාත් වාරි.දෙ.	ගොවි සංවිධාන කෘ.දෙ.
2 වාරිමාර්ග පද්ධතිය කැලෑවෙන් වැසී ඇත. නඩත්තු ඉතා දුර්වලයි, ගොවි සංවිධානයේ ආයතන සංවර්ධන විෂය තුළ පවතින දුර්වලතා.	0.1															1 CMC 2 CSIAP 3 ගොවිජන සං.දෙ. 4 ගොවි සංවිධාන	පළාත් වාරි.දෙ.
3 කට්ටකඩුව, පෙරහන හා ගස්ගොම්මන නැත.	0.4															1 CMC 2 CSIAP 3 ගොවි සං.දෙ. 4 පොලිසිය 5 වන සං.දෙ.	ගොවි සංවිධාන පළාත් වාරි.දෙ. පළාත් වාරි.දෙ.
4 කුඹුරු වල ලවණ වැඩිවීම නිසා අස්වැන්න අඩුවීම.	0.4															1 CMC 2 CSIAP 3 ගොවි සං.දෙ. 4 පළාත් වාරිමාර්ග	ගොවි සංවිධාන
5 කෘෂි මාර්ග කැඩී ඇත.	0.6															1 CMC 2 CSIAP 3 ගොවි සං.දෙ. 4 පළාත් වාරි.දෙ.	ගොවි සංවිධාන

6 වැව් වල මිරිදිය මත්ස්‍ය සම්පත නැත.	0.2															1 CMC 2 CSIAP 3 ගොවිජන සං.දෙ. 4 ජල ජීවී වගා සං.අධි.	ගොවි සංවිධාන
7 අවිධිමත් සත්ව පාලනය නිසා සිදුවන හානි ඇත. (වාරිමාර්ග පද්ධතියට හා වගාවන් සඳහා)	0.2															1 CMC 2 CSIAP 3 ගොවි සං.දෙ.	ගොවි සංවිධාන
8 වාන් ඇල හරහා කුඹුරු වලට ජලය ලබා ගැනීම නිසා ඇල කඩාගෙන යාම හා ජලය අපතේ යාම.	0.3															1 CMC 2 CSIAP 3 ගොවි සං.දෙ. 4 පළාත් වාරිමාර්ග	ගොවි සංවිධාන
9 වැව් වල රඳාපවතින ජලය වගාවට ප්‍රමාණවත් නැත. වැව් වල රොන් මඩ පිරි ඇත.	0.7															1 CMC 2 CSIAP 3 ගොවි සං.දෙ. 4 පළාත් වාරිමාර්ග	ගොවි සංවිධාන
10 අලි මිනිස් ගැටුම් උග්‍ර වී ඇත. (අලි ගහනය වැඩිවීම හා මිනිසුන් කැලෑව ආක්‍රමණය කිරීම)	0.4															1 CMC 2 CSIAP 3 ගොවි සං.දෙ. 4 වන ජී.සං.දෙ.	ගොවි සංවිධාන
11 අනවසරයෙන් වැව්/ රක්ෂිත අල්ලාගැනීම.	0.3															1 CMC 2 CSIAP 3 ගොවි සං.දෙ. 4 ගොවි සංවිධාන	පොලිසිය

6 එල්ලංගාව යෝජිත ක්‍රියාකාරී සැලැස්ම හා දළ ඇස්තමේන්තව - පීල්ල වැව එල්ලංගාව

අනු අංක	දළ ඇස්තමේන්තුගත වියදම්/ සහ යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම් තම්මැන්නාව එල්ලංගාව	ආසන්න වියදම් (රු.මි.)	ඔ/ නො	දෙ/ ජන	මා/ අ ප්‍රේ	මැ/ ජන	ජන /අ ප්‍රේ	සැ/ ඔ	නො / දෙ		
1	හේන් වගාව නිසා සිදුවන පාංශු ඛාදනයෙන් වැව් ගොඩවීම.	0.3									
2	වාරිමාර්ග පද්ධතිය කැලැවෙන් වැසී ඇත. (නඩත්තු ඉතා දුර්වලයි ගොවි සංවිධානයේ ආයතන සංවර්ධන විෂය තුළ පවතින දුර්වලතා)	0.1									
3	කට්ටකඩුව හා පෙරහන ගස්ගොම්මන නැත.	0.4									
4	කුඹුරු වල ලවණ වැඩිවීම නිසා අස්වැන්න අඩුවීම.	0.4									
5	කෘෂි මාර්ග කැඩී ඇත.	0.6									
6	වැව් වල මිරිදිය මත්ස්‍ය සම්පත නැත. (පීල්ල වැව සහ)	0.2									
7	අවිධිමත් සත්ව පාලනය නිසා සිදුවන හානි. (වාරිමාර්ග පද්ධතියට හා වගාවන් සඳහා)	0.2									
8	වාන් ඇල හරහා කුඹුරු වලට ජලය ලබා ගැනීම නිසා ඇල කඩාගෙන යාම හා ජලය අපතේ යාම.	0.3									
9	වැව් වල රදාපවතින ජලය වගාවට ප්‍රමාණවත් නැත. (වැව් වල රොන් මඩ පිරී ඇත)	0.7									
10	අලි මිනිස් ගැටුම් උග්‍ර වී ඇත. (අලි ගහනය වැඩිවීම හා මිනිසුන් කැලෑව ආක්‍රමණය කිරීම)	0.4									
11	අනවසරයෙන් වැව් හා රක්ෂිත අල්ලාගැනීම.	0.3									
	Total	3.9									